11. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා හෝ දැනට ඔබට එරෙහිව සිදු කෙරෙමින් පවතින අධිකරණ ක්‍රියාමාර්ගයක් පවතීද? ඔව්/නැත
11.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

12. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම් තනතුරේ නම, සේවය කරන දෙපාර්තමේන්තුවේ නම සහ ලිපිනය :————.

13. අයදුම්කරු මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයෙක් නම් එසේ ඉවත් වීමට හේතුව :————.

14. *විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :*
14.1 විභාග ගාස්තු ගෙවූ බැංකුවේ නම :————.
14.2 රිසිට්පත් අංකය :————.
14.3 මුදල් ගෙවූ දිනය :————.

මුදල් ගෙවූ ලදුපත නොගැලවෙන සේ අලවන්න.
ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.

15. *අයදුම්කරුගේ සහතිකය :*
(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.
(ඇ) රු. . . . . ක් ගෙවා ලබාගත් ලදුපත අදාල ස්ථානයේ අලවා ඇත.
(ඈ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.
(ඉ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*
මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................. නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය .................... දින මා ඉදිරිපිට දී ඉහත 15 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

17. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි) :*
17.1 ඉහත තොරතුරු සඳහන් ..........................මහතා/මහත්මිය/මෙනෙවිය .................කාර්යාලයේ සේවය කරන බව ද ඔහු/ඇය ................. දින සිට ................. තනතුරක සේවය කරන බව ද සහතික කරමි.
17.2 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය.
සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත.
කිසිදු විනය දඬුවමකට ලක්ව නැත/ඇත.
(විනය දඬුවමකට ලක්ව තිබේනම් තොරතුරු සඳහන් කරන්න) :————.
17.3 ඉල්ලුම් කරනු ලබන තනතුරට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය./නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
නිල මුද්‍රාව.

දිනය :————.
09-399

---

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ දුම්රිය නියාමක තනතුරේ පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බාහිර අයැදුම්කරුවන් බඳවා ගැනීමේ ලිඛිත තරග විභාගය - 2013

(උක්ත කරුණ හා සම්බන්ධයෙන් 2012.11.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන ලද අපේක්‍ෂකයින් මේ සඳහා නැවත අයැදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ දුම්රිය නියාමක තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා 2013.10.14 වැනි දිනට වයස අවුරුදු 18ට වැඩි සහ 30ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2013.10.14 වේ. සියලුම අයැදුම්පත් එදිනට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කිසිම අයැදුම්පතක් පුද්ගලික නමට එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ නොකළ යුතු ය. අසම්පූර්ණ, අවිධිමත්, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, නිසි පරිදි මුදල් ගෙවා නොමැති සහ ප්‍රමාදවී ලැබෙන අයැදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් තම අයැදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් නියමිත දිනට පෙර එවිය යුතු ය. මෙම විභාගය පැවැත්වීම සඳහා විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට අපේක්ෂිත නගර හා නගර අංක 1 වැනි උපලේඛනයේ දක්වා ඇත. ඉල්ලුම්පත්‍රයේ ඉහළ ශීර්ෂයේ මෙම නගර අංක ලේඛනයට අනුව සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. එහෙත්, ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති නගරවල අයදුම්කරුවන් ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ.

### I වැනි උපලේඛනය
### විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

01. *අයැදුම්පත් කැඳවනු ලබන තනතුර :*
ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ දුම්රිය නියාමක පුහුණු කිරීමේ ශ්‍රේණිය

02. *තනතුරේ රාජකාරි ස්වභාවය :*
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ දුම්රිය නියාමක තනතුරේ රාජකාරී කටයුතු ඉටු කරනු ලබයි. සියළුම දුම්රිය ආරක්‍ෂක නීති, බ්ලොක් රෙගුලාසි හා දුම්රිය උපදෙස් සංග්‍රහය පිළිපදිමින් දුම්රිය මගීන්ගේ ආරක්‍ෂාව තහවුරු කෙරෙන පරිදි දුම්රිය ධාවනය කිරීමේදි පවරනු ලබන රාජකාරී ලැයිස්තුවට අනුව රාජකාරී ඉටු කිරීම.

03. *වැටුප් පරිමාණය :*
පුහුණු කාල සීමාව තුළ පළමුවැනි වසර තුළ මාසිකව රු. 12,920ක් ද, දෙවැනි වසර තුළ මාසිකව රු. 13,040ක් ද වශයෙන් දීමනා ගෙවනු ලැබේ.
නියාමක III පෙළ සඳහා අදාළ වන වැටුප් පරිමාණය
(MN- 3-2006- A) රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 වේ.

04. (අ) *අධ්‍යාපන සුදුසුකම් :*
(i) භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය සහ විද්‍යාව ඇතුළු විෂයයන් 04කට සම්මාන සාමාර්ථයක් සහිතව අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 06කින් සමත් වී තිබීම;
සහ
(ii) අ. පො.ස. (උසස් පෙළ) විභාගයෙන් ශුද්ධ ගණිතය, භෞතික විද්‍යාව සහ තවත් එක් විද්‍යා විෂයයක් ඇතුළුව සියලු විෂයන්ගෙන් එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විද්‍යා විෂයයන් තුනකින් (03) එකවර සමත් වී තිබීම ප්‍රමාණවත් වේ.).

(ආ) *වෘත්තීය සුදුසුකම් :*
ඉහත (අ) i හා ii හි මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් අයැදුම්කරුවන් විසින් ලබා තිබිය යුතුයි :-
(i) මොරටුව විශ්ව විද්‍යාලයෙන් හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව;
*හෝ*
(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව;
*හෝ*
(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;
*හෝ*
(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව;
*හෝ*
(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වැනි කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;
හෝ
(vi) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරනු ලබන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමානයැයි ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.

(ඇ) *කායික සුදුසුකම් :*
(i) සෑම අපේක්‍ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.
(ii) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
(iii) උස අවම වශයෙන් අඩි 05 අඟල් 04 ක් විය යුතු අතර, ප්‍රාශ්වාසයේ දී පපුව අඟල් 32ට නොඅඩු විය යුතු ය.
(iv) 6' 6', 6' 6' අක්ෂි දෘෂ්ඨි පරීක්‍ෂණයකින් සමත් විය යුතු ය.

*(ඈ) වෙනත් සුදුසුකම් :*
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යුක්ත විය යුතු ය.
(iii) අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ පිරිමි අයදුම්කරුවන් පමණි.

*සටහන.*—මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලබන දිනට ඉහත සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයැදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

*05.බඳවා ගැනීමේ ක්‍රමය :*
ඉහත (04) හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා විවෘත ලිඛිත තරග විභාගයක් පවත්වා ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ. අයැදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවැති පුරප්පාඩු පමණක් පුරවන අතර පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු නොකරයි.

06. *බඳවා ගැනීමේ පරීක්‍ෂණයේ විභාග පරිපාටිය :-*
(i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.
(ii) *විභාග ක්‍රමය :*
(අ) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ.
(ආ) සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ ඉහත (04) යටතේ සුදුසුකම් ලබා ඇති භාෂා මාධ්‍යයෙනි. ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.
(iii) *විභාගයේ විෂයයන් :*
(අ) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්‍ෂණය
(ආ) තාක්‍ෂණ දැනුම
(iv) *විෂය නිර්දේශය :*
(අ) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්‍ෂණය
කාලය පැය 1 යි, ලකුණු 100 යි.
අපේක්‍ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය ගණිත ගැටලු, සාමාන්‍ය දැනීම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.
(ආ) *තාක්‍ෂණ දැනුම* - කාලය පැය 03 යි. ලකුණු 100 යි.
මූලික තාක්‍ෂණ දැනුම හා යන්ත්‍ර සූත්‍ර පිළිබඳ දැනුම මැනීමට පිළියෙල කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.
(v) *තේරීම් පරිපාටිය :*
එක් එක් විෂයයකින් ලකුණු 50%ක් බැගින් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයැදුම්කරුවන් විභාගය සමත් වූ අය සේ සැලකෙන අතර, මෙම විභාගයෙන් විෂයයන් දෙකෙන්ම වැඩි ලකුණු ලබා සමත්වන අපේක්‍ෂකයින් සම්මුඛ පරීක්‍ෂණයකට කැඳවා සුදුසුකම් පරීක්‍ෂා කරනු

ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමක් සිදු කරනු නොලැබේ. අයැදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාව අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ දුම්රිය නියාමක පුහුණු කිරීමේ ශ්‍රේණියට පත් කරනු ලැබේ. පත්කරනු ලැබීම සඳහා අපේක්ෂකයින් තෝරා ගනු ලබන්නේ ඉහත 06හි IV යටතේ දක්වා ඇති කරුණුවලට යටත්ව විභාගයේ ඉහලම ලකුණු ලබා ඇති කුසලතා අනුපිළිවෙලට අනුව ය.

07. *අයැදුම්පත් සකස් කිරීමට හා සම්පූර්ණ කිරීමට උපදෙස් :*

(i) අයදුම්පත A 4 (යතුරුලියන කඩදාසි) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු ය. (අයැදුම්පත තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි)
අයැදුම්පතේ—
1 වැනි පිටුවේ 01 සිට 08 තෙක් කරුණු ද,
2 වැනි පිටුවේ 09 සිට 11 තෙක් කරුණු ද,
3 වැනි පිටුවේ අත්සන සහතික කිරීම හා දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය ද ඇතුළත් විය යුතු ය.
ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයැදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයැදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයැදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයැදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

(ii) අදාළ විභාගය සඳහා විභාග ගාස්තුව රු. 500කි. එය විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇමිණිය යුතු ය. මෙම ලදුපතෙහි ඡායා පිටපත් ඉදිරිපත් කිරීම හෝ වෙනයම් ආකාරයකට මුදල් ගෙවීම අයැදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ. තව ද විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අයැදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ දුම්රිය නියාමක පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත තරග විභාගය - 2013" යන්න සහ ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා නගර අංකය සඳහන් කරන්න.

(iv) බාහිර අයැදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීම : රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු, රා. ප. ච. 6/2006 අනුව රු. 19,755 ක මාසික ආරම්භක ඒකාබද්ධ වැටුපක් හෝ ඊට වැඩි ආරම්භක වැටුපක් හෝ ලබන රජයේ නිලධාරියකු විසින් සිදු කළ යුතු ය.

(v) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු පුද්ගලයන්ගේ අත්සන් තම ආසන්නතම සේවා ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. මොවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවීම අනිවාර්ය වේ.

(vi) *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර තැපැල් මගින් එවනු ඇත. තරග විභාගයට පෙනී සිටීම සඳහා විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට් නිවේදනය* අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(vii) අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයැදුම් පත්‍රයෙහි පිටපතද, ගෙවන ලද විභාග ගාස්තුවට අදාල ලදුපතෙහි පිටපත ද, ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව, අයැදුම් කරන ලද විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකයද සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයැදුම්කරුවකු නම් ඔබගේ ඉහත විස්තර සමඟ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින්ම යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත.

(viii) "විභාග අපේක්ෂකයන් විභාගයට පෙර තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කරවා ගත යුතුය. විභාගයට පළමුවෙන්ම පෙනී සිටින දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත."

(ix) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාග වලදී අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණි.

(x) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(xi) විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවේ.

08. *සේවා කොන්දේසි :*
බඳවා ගනු ලබන්නේ පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා වන අතර එම කාලයේ දී පළමු වසර තුළ මාසිකව රු. 12,920 ක දීමනාවක් ද, දෙවැනි වසර තුළ මාසිකව රු. 13,040 ක දීමනාවක් ද ලබා දෙනු ඇත. පුහුණු කාල සීමාව වසර දෙකකි. පුහුණුව සාර්ථකව නිම කළ පසු III වැනි ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ තබනු ලැබේ.

09. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තව දුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයට බැඳුනු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් වසර 05ක් තුළ ලබා ගත යුතුය. එම ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරින්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ලැබේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධානවලටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ආයතන කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධානවලටත් යටත්ව කටයුතු කළ යුතුය. එමෙන්ම විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

(මේ අනුව A - 4 කඩදාසිවල දෙපසම භාවිත කරමින් පිළියෙල කරගත් අයැදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයැදුම්පත් කැඳවීමේ නිවේදනය කියවා හොඳින් වටහා ගත යුතු ය.)

ආදර්ශ අයැදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

| | |
|---|---|
| විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍යය<br>2 - සිංහල<br>3- දෙමළ<br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න) | |
| පුරවැසිභාවය<br>පරම්පරාවෙන් -1<br>ලියාපදිංචි වීමෙන් -2<br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න.) | |

| විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය | නගරය | නගර අංකය |
|---|---|---|
| 1 වැනි කැමැත්ත | | |
| 2 වැනි කැමැත්ත | | |
| විභාග නිවේදනයේ ආරම්භක ඡේදය බලන්න. ඉල්ලුම් කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. | | |

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ දුම්රිය නියාමක තනතුරේ පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බාහිර අයැදුම්කරුවන් බඳවා ගැනීමේ ලිඛිත තරග විභාගය - 2013

Written Competitive Examination for Recruitment of External Candidates for the Post of Guard Trainer Grade, 2013 - Sri Lanka Railway Department

01. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.
(උදා. : PERERA R. M.)

02. මුල'කුරුවලින් හැඳින්වෙන නම :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

03. ස්ථිර ලිපිනය :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී 1
පුරුෂ 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජන වර්ගය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න).
සිංහල - 1/ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2/ඉන්දියා ද්‍රවිඩ - 3/මුස්ලිම් - 4/බර්ගර් - 5/ මැලේ - 6

06. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

07. පදිංචිය :————.
(i) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————. එහි අංකය :
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(iii) දිස්ත්‍රික්කය :————.

08. උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

2013.10.14 දිනට වයස : අවුරුදු | | | මාස | | | දින | | |

09. *අධ්‍යාපන සුදුසුකම් :*
(i) අ. පො. ස. (සා. පෙළ.)
විභාග අංකය:————. වර්ෂය :————.

| *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* | *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|
| (i) | | | (v) | | |
| (ii) | | | (vi) | | |
| (iii) | | | (vii) | | |
| (iv) | | | (viii) | | |

(ii) අ. පො. ස. (උසස් පෙළ) :
විභාග අංකය :————. වර්ෂය:————.

| *අනු. අංකය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :————.
(අදාළ කොටුව තුළ " x " ලකුණ යොදන්න)
ඔව් නැත

11. අයැදුම්කරුගේ සහතිකය :
(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සහ/හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.
(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවාද මම පුද්ගලිකව දරා ගනිමි.
(ඇ) ………… දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු. 500ක් ගෙවා ලබා ගත් අංක …… දරන ලදුපත මේ සමග අමුණා ඇත.

| ලදුපත නොගැලවෙන සේ අමුණන්න.<br>(ඇලවීමෙන් වලකින්න)<br>(ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |
|---|

(ඈ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.
(ඉ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

12. අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරන …………………… මහතා මම පුද්ගලිකව හඳුනමි. ඔහු ……………… දින ඉහත අත්සන මා ඉදිරිපිටදී තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

දිනය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න).

13. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :*
මෙම අයැදුම්පත ඉදිරිපත් කර ඇති …………………… මහතා ………………… දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ………… දින සිට ………… දින දක්වා …………………… වශයෙන් සේවය කර ඇත. ඔහුට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී නැත/ඇත. ඔහුගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය නියාමක පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

09-229

---

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, තාක්ෂණික නොවන බණ්ඩ 2 නිලධර ගණය සඳහා වන වනසත්ත්ව නියාමක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය — 2013

මෙම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින වනසත්ත්ව නියාමක තනතුරට සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත අනුව සකස් කරන ලද අයදුම්පත් 2013.09.22 දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහලින් විභාගයේ නම සඳහන් කළ යුතු වේ. ඉල්ලුම්පත්‍රයේ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද 07 සිට 12 තෙක් ඊළඟ පිටුවලට ද වන ලෙස සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුලත් කළ යුතුය. එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුයි. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

03. මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය වනුයේ,
රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040 (MN01 - 2006 (ඒ))

04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-
(අ) මෙම තනතුර ස්ථිරය විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.

05. වයස : අවු. 18 ට නොඅඩු සහ අවු. 30 ට නොවැඩි විය යුතු ය.

06. අධ්‍යාපන සුදුසුකම්
(අ) (i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් විෂයයන් එකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;
සහ
(ආ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

07. කායික සුදුසුකම් :
(i) අයදුම්කරුවන් මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
(ii) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(iii) පිරිමි අයදුම්කරුවන් සඳහා උස අඩි 05 යි අඟල් 04 කට නොඅඩු විය යුතුය. කාන්තා අයදුම්කරුවන් සඳහා උස අඩි 05 යි අඟල් 02 කට නොඅඩු විය යුතුය.

08 වෙනත් :-
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

9. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :
(1) ලිඛිත විභාගය සමත්වූවන්ගෙන් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් පස් ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවා ලිඛිත විභාගයේ දී හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.
(2) වන සත්ත්ව නියාමක තනතුර සඳහා තෝරාගනු ලබන සියළුම අපේක්ෂකයන් මාස 06 ක පුහුණු කාලයක් සඳහා පුහුණු වනසත්ත්ව නියාමක තනතුර සඳහා බඳවා ගනු ලබන අතර, එම කාලය සඳහා දීමනාවක් පමණක් ගෙවනු ලැබේ. අදාල පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් පමණක් එම තනතුරෙහි ස්ථිර පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන අතර, පුහුණු වන කාලය තුල සේවය අතහැර යන හෝ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට අසමත් වන අයට නැවත මෙම තනතුරට ඉල්ලුම් කිරීමට හිමිකමක් නොමැත.

10. ලිඛිත විභාගය :-
පහත සඳහන් විෂය සඳහා විභාගයක් පවත්වනු ලැබේ. මෙම ලිඛිත විභාගය සමත්වීම සඳහා ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට ඉහල ලකුණු ලබා ගත යුතුය. ලිඛිත විභාගය හා සම්මුඛ පරීක්ෂණය පදනම් කොට පත්වීම් දෙනු ලැබේ.
විභාගය පැවැත්වෙන මාසය, දෙසැම්බර්
විභාගයේ විෂය
1. බුද්ධි පරීක්ෂණය :- කාලය පැය 01 මුළු ලකුණු 100 යි

*විෂය නිර්දේශය*
බුද්ධි පරීක්ෂණය :
අපේක්ෂකයින්ගේ සිතීම, තර්කන හැකියාව, විශ්ලේෂණ හැකියාව, හා තීරණ ගැනීමේ හැකියාව හඳුනා ගැනීමට හැකිවන පරිදි සකස් කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*විභාගය සඳහා ගාස්තුව*.- රු. 500 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් ම ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක් ඇලවිය යුතුය. අදාළ කුවිතාන්සියේ ඡායා පිටපතක් අයදුම්කරු විසින් තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. විභාගය සඳහා ගෙවන මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

1. මෙම විභාගය මෙහි උපලේඛනයේ දක්වා ඇති නගරවලදී පමණක් පැවැත්වේ. ඉල්ලුම්පත්‍රයේ තමා විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තුවන නගර හා නගර අංක කැමැත්තේ අනුපිළිවෙලට දැක්විය යුතුය. ඉල්ලුම්කරන නගරය තුළ විභාගය පැවැත්වීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් නොමැතිනම් එම නගරයට ආසන්න වෙනත් නගරයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් ලබා දීමට කටයුතු කෙරේ. විභාගය සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

2. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අයවලුන් ම විභාගයට ඉල්ලා ඇතැයි උපකල්පනය කරමින් සියලුම අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහිතක කළ ඡායාපිටපතක් ද, ඉල්ලුම්පත් බහා එවන ලද ලිපිය ලියාපදිංචි කළ කුවිතාන්සියද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ෆැක්ස් මගින් යොමු කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

සටහන .- ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයයි.

3. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීමට ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

4. ප්‍රතිඵල නිකුත් කිරීම
ලිඛිත විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණුවල මුළු එකතුව පදනම් කර කුසලතා අනුපිළිවෙලට ප්‍රතිඵල ලේඛනය

සකස් කෙරේ. පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සමත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඇතුලත් ප්‍රතිඵල ලේඛනය වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙනු ඇත.

ලිඛිත විභාගයට හා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත එක් එක් පරීක්ෂණයේදී ලබාගත් ලකුණු වෙන් වෙන් වශයෙන් සඳහන් ප්‍රතිඵල ලේඛනයක් පෞද්ගලිකව ලබා දෙනු ඇත.

11. අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය :- විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකු ම විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතු වේ. පහත සඳහන් ලේඛන වලින් එකක් ඉදිරිපත් කල යුතුය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය;

12. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13. සම්මුඛ පරීක්ෂණය :- වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත. නිර්ණායක මත පදනම් වූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා එක් අපේක්ෂකයෙකුට උපරිම ලකුණු 100 ක් ලබාදෙනු ඇත.

14. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්ගේ නියමය පරිදි වන්නේ ය. එමෙන්ම පුරප්පාඩු පිරවීමට හෝ නොපිරවීමට හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් සතුය.

15. මීට අදාල, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි නිවේදනවල කිසියම් අනනුකූලතාවයක් ඇත්නම් සිංහල නිවේදනයේ සඳහන් කරුණු නිවැරදි සේ සලකා කටයුතු කළ යුතුය.

එච්. ඩී. රත්නායක,
වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්.

**උපලේඛනය**

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක

| නගරය | නගර අංක |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වව්නියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහායි)

**ආදර්ශ අයදුම්පත්‍රය**

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, තාක්ෂණික නොවන ඛණ්ඩ 2 නිලධර ගණය සඳහා වන වනසත්ත්ව නියාමක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013**

**The Open Competitive Examination for the Recruitment to the Posts of Wild Life Guard Non Technical - Segment 2 in the Department of Wildlife Conservation - 2013**

විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍ය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විභාගය සඳහා ඉල්ලුම් කරන නගරය හා නගර අංකය :
(නිවේදනය අනුව)

| නගරය | නගර අංකය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

01. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ SUNIL A. B. :————.
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
02.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :-
ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
3.2 උපන් දිනය :- වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
3.3 ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :
අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐
04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐
05. පදිංචි දිස්ත්‍රික්කය :————.
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
06. දැනට නියුතු තනතුර සහ සේවා ස්ථානය :————.
07. අධ්‍යාපන සුදුසුකම් :————.
08. පසුගිය වර්ෂ පහ (05) ඇතුළත ඔබට විරුද්ධව යම්කිසි විනයානුකූල පරීක්ෂණයක් පවත්වා හෝ ඒ අනුව දඬුවම් කිරීමකට ලක් වී තිබේද? එසේ ඇත්නම් විස්තර සඳහන් කරන්න. :————.
09. අයදුම්කරුගේ ප්‍රකාශය :-
මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද සියලුම තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් අසත්‍ය තොරතුරු දක්වා ඇති බව පත්වීම් ලබා දීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් මාගේ පත්වීම අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි. තවද විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. මුදල් ගෙවන ලද ලදුපත නොගැලවෙන ලෙස අයදුම්පතට අලවන්න.

(i) අංකය :————.
(ii) දිනය :————.
(iii) මුදල් ගෙවූ ස්ථානය :————.
(iv) ගෙවන ලද මුදල : රුපියල් :————.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-

මෙම අයදුම්කරු මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු අද දින මා ඉදිරිපිට දී මෙහි සුපුරුදු අත්සන තබන ලද බවත්, මෙම අත්සන ඔහුගේ බවත් සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන හා නිල මුද්‍රාව.

(රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, නීතිඥවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී, පූජ්‍ය ස්ථානයක් භාර පූජකවරයෙකු හෝ රාජ්‍ය සේවයේ මාණ්ඩලික තනතුරක් දරන නිලධාරියෙකු විසින් අපේක්ෂක/ අපේක්ෂිකාවගේ අත්සන සහතික කළ යුතුය.)

12. දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියාගේ සහතිකය :-
(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම ආයතනයේ .............................. තනතුර දරන ..................... මයාගේ/මෙයගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එහි ලදුපත අලවා ඇති බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු අනුප්‍රාප්තිකයෙකු රහිතව සේවයෙන් නිදහස් කළ හැකි බවත් දනිමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

ආයතන ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

09-327

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

යොමු අංකය : SRS/F. 7066.

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**
**ප්‍රසම්පාදන දැන්වීම**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත දුම්රිය මැදිරි රෝද සඳහා ටයර් 500ක් සැපයීමේ ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංක : SRS/F. 7066

ශ්‍රී ලංකාවේ, කොළඹ තැ. පෙ. 355 දරන, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දුම්රිය මූලස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති තැන විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත මැදිරි රෝද සඳහා ටයර් 500ක් සැපයීම සඳහා නිෂ්පාදකයන්/සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු සඳහා දැන් ඇරයුම් කරනු ලැබේ. ඇටෝර්නි බලය පවරනු ලැබූ පිළිගත් නියෝජිතයින් මගින් නිෂ්පාදකයින්ට තම ලංසු ඉදිරිපත් කළ හැක.

02. 2013.10.15 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලැබේ.

03. ප්‍රසම්පාදන ගාස්තුව වශයෙන් ශ්‍රී ලංකා රුපියල් 10,000 ගෙවා, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය අධිකාරි කාර්යාලයෙන් ලංසු ලියවිලි හා ලබාගන්නා ආකෘති පත්‍ර මත පමණක් සටහන් කළ ලංසු ඉදිරිපත් කළ යුතු අතර, එම ආකෘති පත්‍ර සතියේ දිනවල 2013.08.21 වැනි දින සිට 2013.10.14 වැනි දින දක්වා ශ්‍රී ලංකා වේලාවෙන් පෙ. ව. 9.00 හා ප. ව. 3.00 අතරතුර නිකුත් කරනු ලැබේ. ඉහත සඳහන් දිනයන්හි අතරතුර රු. 10,000 කට සමාන මුදලක් නිදහසේ පරිවර්තනය කළ හැකි විදේශ මුදලකින්, ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත ගෙවා එම කාර්යාල මගින් ලංසු ලියවිලි, ශ්‍රී ලංකාවේ තම තානාපති කාර්යාලයට භාරදෙන ලෙසට, ශ්‍රී ලංකාවේ , කොළඹ 10, ඕල්කට් මාවත්, දුම්රිය ගබඩා අධිකාරී වෙතට ඉල්ලීමක් කිරීමට විදේශීය ලංසුකරුවන්ට හැක. ඉහත සඳහන් කළ රු. 10,000 ක ප්‍රසම්පාදන ගාස්තුව හෝ එම වටිනාකමට නිදහසේ පරිවර්තනය කළ හැකි විදේශ මුදලකින් ගෙවූ මුදල් ආපසු නොගෙවන ගාස්තු වේ.

04. ලංසු භාරගැනීම අවසන් කළ වහාම ශ්‍රී ලංකාවේ, කොළඹ, තැ. පෙ. 355 දරන ස්ථානයේ, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවා කාර්යාලයේ දී එම ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට සහභාගි වන ලෙස ඇරයුම් කරනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලේඛනගත තැපෑලෙන් හෝ රැගෙනවිත් පහත ලිපිනයට භාරදිය යුතුයි. සභාපති තැන, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, දුම්රිය සේවා මූලස්ථානය, තැ. පෙ. 355, ඕල්කට් මාවත, කොළඹ.

06. ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ගාස්තුවකින් තොරව ලංසු ලියවිලි පරීක්ෂාකර බැලිය හැක.

07. කරුණාකර වැඩිමනත් තොරතුරු සඳහා ශ්‍රී ලංකාවේ, කොළඹ, ඕල්කට් මාවතේ, තැ. පෙ. අංක 1347, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ. දුම්රිය ගබඩා අධිකාරි තැනගෙන් විමසන්න.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2473328
ෆැක්ස් අංක : 94 (11) 2432044 හා
ඊමේල් : srs.slr@gmail.com ඔස්සේ සම්බන්ධ වී ලබාගත හැක.

සභාපති තැන, .
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

09-360

---

යොමු අංකය : SRS/F. 6957.

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**
**ප්‍රසම්පාදන දැන්වීම**
**රඹුක්කන, කිරිවැල්ලපිටියෙහි පවත්නා ගර්හිත දුම්රිය මැදිරි සුන්බුන් බැහැර කිරීම**
**SRS/F. 6957**

කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, රඹුක්කන, කිරිවැල්ලපිටියේ පවත්නා ගර්හිත දුම්රිය මැදිරි සුන්බුන්, (දළ වශයෙන්) මෙට්‍රික් ටොන් 196, බැහැර කිරීම සඳහා ලංසු භාරගනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2013.10.10 වැනි දින පස්වරු 2.00 ට අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන ලිපිලේඛන ගාස්තු රුපියල් 3,000.00 (රුපියල් තුන් දහසක් පමණයි) ක් දුම්රිය ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලයට ගෙවීමෙන්, 2013.10.09 වැනි දින පස්වරු 3.00 දක්වා, කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

04. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී, ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලය පැවරූ, නියෝජිතයන්හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

05. මුද්‍රා තැබූ ලංසු, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන් පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කොට් මාවත,
කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී, ලංසු ලිපිලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැකිය.

07. වැඩිදුර විස්තර සඳහා, කරුණාකර, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ, දුම්රිය ගබඩා අධිකාරි අමතන්න. දුරකථන අංක : 2438078, 2436818, ෆැක්ස් අංකය : 2432044.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

09-361

---

යොමු අංකය : SRS/F. 7055

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**
**ප්‍රසම්පාදන දැන්වීම**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත චීනයේ නිෂ්පාදිත නව දුම්රිය මැදිරි සඳහා "සොලිඩ් වීල්ස්" (මොනො බ්ලොක්වීල්) 360ක් සැපයීම පිළිබඳ ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7055

ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත චීනයේ නිෂ්පාදිත නව දුම්රිය මැදිරි සඳහා " සොලිඩ් වීල්ස්" (මොනො බ්ලොක් වීල්) 360ක් සැපයීම සඳහා ශ්‍රී ලංකාව, කොළඹ තැ. පෙ. 355 දරන දුම්රිය සේවා මූලස්ථානය වෙනුවෙන් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති තැන විසින් නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. ඇටෝර්නි බලය පවරනු ලැබූ පිළිගත් ඔවුන්ගේ නියෝජිතයින් මගින් ද, නිෂ්පාදකයින්ට තම ලංසු භාරදිය හැක.

02. 2013.09.24 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කරනු ලැබේ.

03. ආපසු නොගෙවන රු. 2,500 ක ගාස්තුවක් හෝ නිදහසේ පරිවර්තනය කළ හැකි මුදල් ඒකකයකින් ගෙවා ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් 2013.09.23 වැනි දින ශ්‍රී ලංකා වේලාවෙන් ප. ව. 3.00 දක්වා ලබාගත හැකි ආකෘතිපත් මත සටහන් කරනු ලැබූ ලංසු පමණක් භාරදිය යුතු ය.

04. ලංසු භාරගැනීමේ කාලය හා දිනය ඉකුත් වූ වහාම ශ්‍රී ලංකාවේ කොළඹ 10, දුම්රිය සේවා මූලස්ථානයේ දී එම ලංසු විවෘත කරනු ලබන අතර ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට මෙම අවස්ථාවට සහභාගි විය හැක.

05. මුද්‍රා තබන ලද ලංසු ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය සේවා මූලස්ථානයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති තැන වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැක.

06. ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ගාස්තුවකින් තොරව ලංසු ලියවිලි පරීක්ෂා කොට බැලිය හැක.

07. වැඩිමනත් විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරි තැන දුරකථන අංක 94 (11) 2478328, ෆැක්ස් අංක 94 (11) 2432044, ඊමේල් srs.slr@gmail.com හා www.railway.gov.lk වෙබ් අඩවිය හරහා සම්බන්ධ වන්න.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

09-362

---

**මහාධිකරණය - අනුරාධපුර**

රාජසන්තක කරන ලද මෝටර් වාහන විකිණීම

අනුරාධපුර මහාධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත සඳහන් මෝටර් වාහනය විකිණීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

| අනු. අංකය | නඩු අංකය | වාහනය | ටෙන්ඩර් ඇප තැන්පත් - ආපසු ගෙවන | ටෙන්ඩර් ඇප තැන්පත් - ආපසු නොගෙවන |
|---|---|---|---|---|
| 01 | 40/09 | UPLD 4278 JAC ලොරි රථය | 7,500 | 10,000 |

02. 2013.09.16 වැනි දින සිට 2013.10.03 වැනි දින දක්වා සතියේ වැඩ කරන දින වල පෙ. ව. 10.00 සිට ප. ව. 1.00 දක්වා මහාධිකරණය භූමියේ දී ඉහත සඳහන් වාහනය පරීක්ෂා කර බැලිය හැක.

03. එම වාහනය සඳහා ඉහත දක්වෙන පරිදි ආපසු නොගෙවන තැන්පත් මුදලක් අනුරාධපුර මහාධිකරණය වෙත ගෙවා ලංසු ආකෘති පත්‍ර 2013.09.16 සිට 2013.10.03 වැනි දින පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා කාලය තුළ ලබා ගත හැකි අතර එම කාලය තුළ දී ආපසු ගෙවන තැන්පත් මුදල ගෙවා ලබා ගන්නා ලදුපත ලංසු අයදුම්පතට ඇමිණිය යුතු ය.

04. ලංසු කොන්දේසි පරිදි සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු මුල් පිටපත හා අනු පිටපත වශයෙන් පිටපත් දෙකකින් සකස් කර එම පිටපත් වෙන වෙන ම කවර වල බහා මුද්‍රා තබා එහි මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර එම කවර දෙක ම එක් කවරයක බහා මුද්‍රා තැබිය යුතු ය. එම මුල් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "මෝටර් වාහනය සඳහා මිල ගණන්" ලෙස ද වාහනයේ අංකය ද සඳහන් කර 2013.10.04 වැනි දින පෙ. ව. 11.00 ට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ නැතහොත් ඒ සඳහා මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

සභාපති,
මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව,
මහාධිකරණය,
අනුරාධපුර.

05. එදිනම පෙ. ව. 11.30 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවේ දී ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

සුනන්ද කුමාර රත්නායක,
මහාධිකරණ විනිසුරු,
අනුරාධපුර.

2013 අගෝස්තු මස 22 වැනි දින,
අනුරාධපුර මහාධිකරණයේ දී ය.

09-185

යොමු අංකය : SRS/F. 6987

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසුකරුවන් සඳහා දැන්වීමයි

**කොළඹ අංගනයේ හා රත්මලාන අංගනයේ පවත්නා යකඩ යතු කුඩු මිලදීගෙන ඉවත් කර ගැනීම**

SRS/F. 6987

කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, එක් වසරක කාලයක් සඳහා, දුම්රිය වැඩපලවල්/අංගනයන්හි එක්රැස් වී ඇති යකඩ යතු කුඩු මිල දී ගෙන ඉවත් කර ගැනීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2013.09.25 වැනි දින පස්වරු 2.00 ට අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන ලිපිලේඛන ගාස්තු රුපියල් 3,000.00 (රුපියල් තුන් දහසක් පමණයි) ක් ගෙවීමෙන් 2013.09.24 වැනි දින පස්වරු 3.00 දක්වා කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

04. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, කොළඹ 10, ඕල්කොට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, සාමාන්‍යාධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන් හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

05. මුද්‍රා තැබූ ලංසු, ලියාපදිංචි, තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන්, සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), සාමාන්‍යාධිකාරි කාර්යාලය, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කොට් මාවත, කොළඹ 10 යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය.

06. කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන, නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැකිය.

07. වැඩිදුර විස්තර සඳහා කරුණාකර පහත සඳහන් අය අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත,
කොළඹ 10.

දුරකථන අංක : 2438078, 2436818, ෆැක්ස් අංක : 2432044.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

09-363

---

# බඩු බාහිරාදිය විකිණීම්

## ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණය

ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2013.09.28 වැනි සෙනසුරාදා දින පෙ. ව. 9.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවෙලේ ම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැණුම්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

උමේෂ් ශානක කලංසූරිය,
මහෙස්ත්‍රාත්,
ගාල්ල.

2013 අගෝස්තු මස 15 වැනි දින,
ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

භාණ්ඩ වෙන්දේසිය - 2013

**ගාල්ල මහෙස්ත්‍රාත් උසාවිය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහන අංකය* |
|---|---|---|
| *යතුරු පැදි :* | | |
| 01. | 37296 | එස්. පී. ටී. ජී. 5405 |
| 02. | 10077 | 132- 7776 |
| 03. | 24304 | 115- 1776 |
| 04. | 25555 | එස්. පී. එම්. ඒ. 9675 |
| 05. | 94321 | එස්. පී. යූ, එෆ්. 7001 |
| 06. | ඒ. ආර්. 2601 | එස්. පී. එම්. ඉසෙඩ්. 6184 |
| 07. | 27680 | 129-7652 යතුරු පැදිය |
| 08. | 99555 | එස්. පී. ටී. එච්. 9955 යතුරුපැදිය |
| 09. | 60941 | එස්. පී. ටී. බී. 8246 |
| *ත්‍රිරෝද රථ :* | | |
| 10. | 27633 | එස්. පී. කිව්. බී. 9253 |
| 11. | ඒ. ආර්. 2087 | 204-3963 |
| 12. | 97132 | එස්. පී. ජේ. එච්. 6840 |
| 13. | 63378 | 200- 9218 |
| 14. | 77420 | 14 - 0521 |
| *ට්‍රැක්ටර් එන්ජිම සමග ට්‍රේලර් :* | | |
| 15. | 80853 | එස්. පී. එස්. ඒ. 2212 |
| 16. | 65286 | එස්. පී. එච්. ජී. 4671 |
| 17. | 84712 | 73 ශ්‍රී 0064 |
| 18. | 64350 | 77 - 4863 |
| 19. | 85194 | 340-0834 |
| 20. | 86862 | එස්. පී. ජේ. ඉසඩ්. 2863 |
| 21. | 95498 | එස්. පී. එස්. සී. 2439 |
| 22. | 64112 | එස්. පී. ජේ. එක්ස්. 6084 |
| *ට්‍රැක්ටර් එන්ජිම :* | | |
| 23. | 94011 | සින්ෆින් වර්ගයේ එන්ජිම |
| 24. | 94012 | චේන්ජ් ෆැන් වර්ගයේ එන්ජිම |
| 25. | 95004 | හුවාෂි වර්ගයේ එන්ජිම |
| 26. | 91793 | එඩ්ග්‍රෝ වර්ගයේ එන්ජිම |
| 27. | 85760 | ෆාම් මාස්ටර් වර්ගයේ එන්ජිම |
| *පාපැදි :* | | |
| 28. | ඒ. ආර්. 182/2013 | පාපැදි 02 |
| 29. | ඒ. ආර්. 1142/2012 | පාපැදි 01 |
| 30. | ඒ. ආර්. 1144/2012 | පාපැදි 03 |
| 31. | ඒ. ආර්. 1481/2012 | පාපැදි 01 |
| 32. | ඒ. ආර්. 1483/2012 | පාපැදි 01 |
| 33. | ඒ. ආර්. 1504/2012 | පාපැදි 01 |
| 34. | ඒ. ආර්. 1505/2012 | පාපැදි 01 |
| 35. | ඒ. ආර්. 2674/2012 | පාපැදි 01 |
| 36. | ඒ. ආර්. 1508/2012 | පාපැදි 01 |
| 37. | ඒ. ආර්. 1486/2012 | පාපැදි 01 |
| 38. | ඒ. ආර්. 1484/2012 | පාපැදි 01 |
| 39. | ඒ. ආර්. 1479/2012 | පාපැදි 01 |
| 40. | ඒ. ආර්. 1506/2012 | පාපැදි 01 |
| 41. | ඒ. ආර්. 1485/2012 | පාපැදි 01 |
| 42. | ඒ. ආර්. 1482/2012 | පාපැදි 01 |
ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත හම්බන්තොට, ටවර්හිල් මාවත අංක 7 ඒ දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකාර මහතාට ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

දුරකථන අංක : 047 - 2220900, 2220901, 2220903
ෆැක්ස් අංකය : 047 - 2220900.

ජී. ජී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංක : 041-2228731, 071- 4438516.

09-319

---

## සෙලාන් බැංකුව පීඑල්සී - පුත්තලම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ පුත්තලම ලියාපදිංචි කාර්යාලය පිහිටි සහ සිය ලියාපදිංචි අංකය පී වී 65623 ඇති 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන එන්. එස්. කේ. ඉම්පෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කොළඹ 05 හි නඩරාජා සෙන්තිල් කුමාර යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*1 වැනි වෙන්දේසිය* :

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලමේ උතුරු පුත්තලම් පත්තුවේ සිරම්බියාඩි පිහිටි මිනුම්පති විසින් සාදන ලද අංක පීපීජ් 1479 දරන සැලැස්මේ සඳහන් සිරම්බියාඩි මිඩ්ල් ක්ලාස්ලෑන්ඩ් නැමති ඉඩමේ ලොට් 12 ලකුණු කළ සම්පූර්ණ ඉඩම් කොටස අක්කර විසි පහයි රූඩ් එකයි පර්චස් තිස්පහක් (අ. 25 රූ. 01 පර්. 35) ක් විශාල බිම, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම මෑතක මැනීමක් අනුව

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, සිරම්බියාඩි විලේජ් හි පිහිටි සිරම්බියාඩි බලයලත් මිනුම්දෝරු ඒ. ඕ. එම්. නජිබ් විසින් සාදන ලද අංක 2007.11.07 දිනැති අංක 283 දරන සැලැස්මේ නිරූපනය වන මිඩ්ල් ක්ලාස්ලෑන්ඩ් නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම් කොටස අක්කර විසිපහයි රූඩ් එකයි පර්චස් තිස්පහක් (අ. 25 රූ. 1 පර්. 35)ක් විශාල බිම, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2013 ඔක්තෝබර් මස 03 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම*. - පුත්තලම සිට අනුරාධපුර මාර්ගය ඔස්සේ 6 වන කි. මී. කණුව දක්වා පැමිණ වම්පසට ඇති සුනිල් ආනන්ද මාවතට හැරෙන්න. එම මාර්ගයේ තවත් මඳ දුරක් ගිය විට පාන්ඩිගල පාර හමුවේ. පාන්ඩිගල පාර ඔස්සේ තවත් කි. මී. 3.2ක් පමණ ගිය විට වම්පසට ඇති මාර්ගයට හැරෙන්න. එම මාර්ගය ඔස්සේ තවත් මීටර් 150ක් පමණ ගිය විට මාර්ගයේ දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත.

*2 වැනි වෙන්දේසිය* :

පුත්තලම් පත්තු ආදායම් නිලධාරිගේ කොට්ඨාසය තුළ සෙල්ලන්කන්දල් මයිනර් හෙඩ්මන් ඩිවිෂන් හි දැන් වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම් පත්තු කොට්ඨාසයේ උතුරු පුත්තලම් පත්තුවේ, ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසය තුළ නාගවිල්ලු ගමේ පිහිටි මිනුම්පති විසින් සාදන ලද අංක 1479 දරන සැලැස්මේ සඳහන් සින්නේ නාගවිල්ලු නමැති ඉඩමේ ලොට් 35 ලෙස ලකුණු කළ සම්පූර්ණ ඉඩම් කොටස අක්කර විසිපහයි පර්චස් විසිදෙකක් (අ. 25 රූ. 0 පර්. 22)ක් විශාල බිම, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෑතක මැනීමක් අනුව,

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, නාගවිල්ලු ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඕ. එම්. නජිබ් විසින් සාදන ලද අංක 2008.03.03 දිනැති අංක 552 දරන සැලැස්මේ නිරූපනය වන සින්නනාගවිල්ලු නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස අක්කර විසිපහයි පර්චස් විසිදෙකක් (අ. 25 රූ. 0 පර්. 22) ක් විශාල බිම, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2013 ඔක්තෝබර් මස 03 වැනි දින පස්වරු 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම*. - පුත්තලම සිට අනුරාධපුර මාර්ගය ඔස්සේ 3 වැනි කි. මි. කණුව දක්වා පැමිණ තවත් මද දුරක් ගිය විට පිහිටි ලුණුලින්ද මංසන්ධිය දක්වා පැමිණ වම්පසට ඇති සිරිල් ජැන්ස් මාවතට හැරෙන්න. එම මාර්ගයේ තවත් කි. මී. 3ක් පමණ ගිය විට මාර්ගයේ වම්පස අදාළ දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම රජයේ *ගැසට් පත්‍රයේ* 2013.07.19 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2013.07.23 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2013.07.25 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*. - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% ද, විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2456473, 2456475.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක 011- 3068185, 011- 2572940.

09-291

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සිමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ජේ. එස්. ප්‍රනාන්දු සහ ඒ. වී. ආර්. ප්‍රනාන්දු.

ගිණුම් අංක : 0042 5001 2379 සහ 0042 5002 2641.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2012 නොවැම්බර් මස 29 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හතලිස් හතර ලක්ෂ පනස් තුන් දහස් එකසිය අසූ පහයි ශත තිස් පහක (රු. 4,453,185.35) මුදල ද, 2012 ඔක්තෝබර් මස 20 වැනි දින සිට අය විය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි පන් ලක්ෂයක (රු. 2,500,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවක් (15%) හා තවත් රුපියල් දහ හත් ලක්ෂ විසි හය දහස් තුන්සිය තිහයි ශත අනූවක (රු. 1,726,330.90) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොළිය ද, දැන්වීම ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2013.04.26 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2013.03.22 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2013.10.02 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ කොළඹ ලියාපදිංචි කොට්ඨාසය තුළ සහ වත්තල ප්‍රාදේශීය සභාවේ හැඳල උප කාර්යාලය තුළ තිඹිරිගස්යායේ පිහිටි තිඹිරිගස්යාය පාර වරිපනම් අංක 44/2 දරන "අඹගහවත්ත, කහටගහවත්ත නොහොත් කැටකැළගහවත්ත'' යයි කියනු ලබන ඉඩමට (2000 අප්‍රේල් මස 02 දාතම දරන පිටසන පරිදි) බලයලත් මානක තැන එච්. ආර්. සමරසිංහ යන අය විසින් සාදන ලද 1995 අගෝස්තු මස 20 දාතම හා අංක 2247 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පී. ජෝශප් යන අයගේ ඉඩම සහ පාර (බලයලත් මානක තැන එස්. ලෝකනාදන් යන අය විසින් සාදන ලද අංක 838 දරන පිඹුරේ ලොට් බී 2) නැගෙනහිරට : ලොට් 1 බී, දකුණට : ලෙට් 1 සී සහ ඒ. ඒ. තෙරේසා යන අයගේ ඉඩම සහ බස්නාහිරට : විනිෆීඩා නානායක්කාර යන අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම එකක් (අ. 0 රූ. 0 පර්. 12.1) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2247 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව බී 858/289 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

09-358

---

## මහජන බැංකුව. - නිට්ටඹුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

නිට්ටඹුව නගරයේ, නිට්ටඹුව කොළඹ මාර්ගයේ රූඩ් 01 පර්චස් 9.5ක් (අ. 0 රූ. 01 පර්. 9.5) ක විශාල බිම් කොටසක් සහ එය තුළ පිහිටි මහල් කිහිපයකින් යුත් ව්‍යාපාරික ගොඩනැගිලි ලිපිනය අංක 577/5, කොළඹ පාර, නිට්ටඹුව.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2013.10.09 වැනි දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා රජයේ *ගැසට් පත්‍රයේ* 2009.11.03 වැනි දින ද, ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත් වල 2010.08.06 වැනි දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම*. - ගම්පහ සිට නුවර පරේ නිට්ටඹුව දෙසට යන විට නිට්ටඹුව නගරයේ සිව් මංසලට මීටර් 400ක් පමණ මෙපිටින් පිහිටි සෙලාන් බැංකුව පිහිටි ගොඩනැගිල්ල සහිත ගොඩනැගිලි සමූහය සුරකුම් දේපළ වේ.

*ගෙවීමේ ක්‍රමය*. - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% ක් ;
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්;
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද;
4. ලිපිකරු හා නිවේදකයේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද;
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ;
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත දී ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නෙගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් ආදළ විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක. ප්‍රාදේශීය කළමනාකාර, මහජන බැංකුව, ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක 033-2222325, 033- 2225008, 033- 2225009
ෆැක්ස් අංක : 033- 2226165, 033- 2226741.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම).

*කාර්යාලය* : අංක 25 "බී", බෙල්මන්ට් වීදිය,
කෙළඹ 12.
දුරකථන අංක : 011-5756356, 011- 2334808 (ෆැක්ස්)
නිවස : 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ
දුරකථන අංක : 011 2419126, 075 - 0883265.

09-396

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඒ ඇන්ඩ් ඩී ඉන්ටනැෂනල්.

ගිණුම් අංකය : 0142 1000 0551.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2012 ජූලි මස 26 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හතලිස් නම ලක්ෂ විසි හය දහස් පන්සිය දොළහයි ශත හතලිස් හතක (රු. 49,26,512.47) මුදල ද, 2012 මැයි මස 23 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් හය ලක්ෂ හතලිස් නම දහස් පන්සිය හැත්තෑ හයයි ශත හැත්තෑ දෙකක ( රු. 46,49,576.72) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2012.09.07 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* , 2012.08.24 වැනි දින "දිවයින", සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.10.04 වැනි දි පෙ. ව. 11.00 පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්ද බණ්ඩාරගම ප්‍රදේශීය සභා සීමාවන් තුළ අරුග්ගොඩ පිහිටි " *දවටගහවත්ත නොහොත් දෙල්ගහවත්ත*" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ඒ. පී. ද සිල්වා යන අය විසින් සාදන ලද 2010 නොවැම්බර් මස 06 දාතම හා අංක 215 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් ඒ, බී, සී. ඩී සහ ඊ වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටස්වලට මායිම්, උතුරට : අංක 3856 දරන පිඹුරේ ලොට් 4, නැගෙනහිරට : අංක 3856 දරන පිඹුරේ ලොට් 4, දකුණට : කේ. සරත් පෙරේරා සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන අරලියගහවත්ත සහ පාර සහ බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර (අරුග්ගොඩ සිට පානදුර දක්වා පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකක් (අක්. 1 රූ. 0 පර්. 0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 215 දරන පිඹුරට අනුව ය.

අංක 215 දරන පිඹුරේ එකී ලොට් ඒ, බී, සී. ඩී සහ ඊ යන සියල්ල ම පහත සඳහන් ඉඩමේ උපබෙදුම් වේ.

එකී අරුග්ගොඩ පිහිටි "*දවටගහවත්ත නොහොත් දෙල්ගහවත්ත*" යැයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද 2006 ජුනි 21 දාතම හා අංක 3856 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 5 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 3856 දරන පිඹුරේ ලොට් 4 සහ පාර, නැගෙනහිරට : අංක 3856 දරන පිඹුරේ ලොට් 4 සහ කේ. සරත් පෙරේරා සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන අරලියගහවත්ත, දකුණටඃ කේ. සරත් පෙරේරා සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන අරලියගහවත්ත සහ ප්‍රාදේශීය සභා පාර සහ බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම හතරයි බිංදුවයි හතරයි හතයි (0.4047 හෙක්ටයාර්) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 3856 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව එෆ් 634/119 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

09-357

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ දැන්වීම

(1) ණය යොමු අංකය : 6796932.

මුල්ලේරියාව නව නගරය, කැලණිමුල්ල, නාගහවෙල පාර, අංක 407/1 හි පදිංචි රණසිංහ ආරච්චිගේ අජිත් හේමන්ත මහතා සහ ටානියා ෆෙලිසියා පොන්නම්පෙරුම මහත්මියගේ උකස් කරන ලද දේපළ විකිණීම

(2) ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් නිවේදනය* යටතේ ප්‍රසිද්ධ කළ යෝජනාවට අනුව 2013.07.26 දිනැති අංක 1821 දරන *ගැසට් පත්‍රයේ* හා 2013.07.15 දිනැති " ඩේලි නිව්ස්", "දිනමිණ" හා "තිනකරන්", යන පුවත්ත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒමත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2013.10.12 වැනි දින පෙ. ව. 11.00 ට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලයේ, අඹතලෙන් පහළ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව (මුල්ලේරියාව උප කාර්යාලය) තුළ කැලණිමුල්ලෙහි පිහිටි නාගහවෙල පාරේ වරිපනම් අංක 123/1, දරන "කෝන්ගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. ඊ. විජේසූරිය විසින් සාදන ලද 2005 ජූලි මස 26 වැනි දිනැති අංක 342 දරන පිඹුරෙහි ලොට් ඒ ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් ඒ උතුරට : හෙන්ද්‍රික් පෙරේරාගේ ඉඩම ද, නැගෙනහිරට : අංක 1232 දරන පිඹුරෙහි ලොට් 1 බී සහ අංක 1734 දරන පිඹුරෙහි ලොට් 2 ද, දකුණට : අංක 1734 දරන පිඹුරෙහි ලොට් 2 සහ එල්. කේ. රත්නවේලිගේ ඉඩම ද, බස්නාහිරට : පාර (ප්‍රා. ස.) ද මායිම්ව එකී අංක 342 දරන පිඹුරට අනුව පර්චස් දහසයක (අ. 0 රූ. 0 පර්.

16) බිම් ප්‍රමාණයකින් යුක්තව එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ සියලු දේ ද වේ.

එකී ලොට් ඒ පහත විස්තර කර ඇති ඉඩම් ඒකාබද්ධ කිරීමකි.

ඉහත කී ආකාරයට කැලණිමුල්ල පිහිටි "කෝන්ගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඊ. සී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1988 සැප්තැම්බර් 24 දිනැති අංක 1232 දරන පිඹුරෙහි ලොට් 1 ඒ ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 ඒ උතුරට : හෙන්ද්‍රික් පෙරේරාගේ ඉඩම ද, නැගෙනහිරට : පිඹුරු අංක 1593 හි ලොට් 1 බී සහ ලොට් 2 ද, දකුණට : පිඹුරු අංක 1593 හි ලොට් අංක 2, බස්නාහිරට ගම් සභාව පාර ද, මායිම්ව එකී අංක 1232 දරන පිඹුරට අනුව පර්චස් නවයක (අ. 0, රූ. 0, පර්. 09) බිම් ප්‍රමාණයකින් යුක්තව එහි ඇති ගහකොළ, ගොඩනැගිලි ආදී සියලු දේ ද වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 696/93 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ආකාරයට කැලණිමුල්ල පිහිටි "කෝන්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. පී. එල්. අබේකෝන් විසින් සාදන ලද 1994 ඔක්තෝබර් මස 14 දිනැති අංක 1734 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : ඊ. කේ. නාලිනීගේ ඉඩම ද, නැගෙනහිරට : පිඹුරු අංක 1734 හි වූ එම ඉඩමේ ම ලොට් 2 ද, දකුණට : එල්. කේ. රත්නවේලිගේ ඉඩම ද, බස්නාහිරට : ගම් සභා පාරද, මායිම්ව එකී අංක 1734 දරන පිඹුරට අනුව පර්චස් හතක (අ. 0, රූ. 0, පර්. 07) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ ගොඩනැගිලි සහ සියලු දේද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 803/260 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. පී. දයා ගුණසිරි,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
නගර ශාඛා කාර්යාලය.
09-365

---

**සෙලාන් බැංකුව පීඑල්සී - බොරැල්ල ශාඛාව**

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

මෙම දේපළ දෙල්ගොඩ පදිංචි ගොඩකුඹුර ගමගේ සරත් යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මීගහවත්ත සහ දරනගම ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් සාදන ලද 1995 දෙසැම්බර් මස 23 වැනි දිනැති අංක 692 ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කට්ටියහේන අළුබෝගහවත්ත සහ නුගගහලන්ද සහ ගල්හේන අළුබෝගහවත්ත සහ නුගගහලන්ද නමැති ඉඩමේ ලොට් 10 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 692 ඒ දරන සැලැස්ම අනුව පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

එකී අංක 692 ඒ දරන සැලැස්මේ ලොට් ආර් 1 (දැන් ලොට් ආර් 01ඒ) සහ (ලොට් ආර් 01 බී) ලකුණු කළ ප්‍රධාන පාරට යන පාර සඳහා වෙන් කිරීම උඩින් මාර්ග අයිතිය සහ වෙනත් අයිතීන් සමගය.

ඉහත සඳහන් දේපළ 2013 සැප්තැම්බර් මස 27 වැනි දින පෙරවරු 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කිරිබත්ගොඩ සිට දෙල්ගොඩ පාරේ මාකොළ සහ මාවරමණ්ඩිය හරහා කි. මී. 7ක් පමණ ගොස් මීගහතැන්න පොලිස් ස්ථානය දක්වා පැමිණ පොලිස් ස්ථානය පසුකළ විට දකුණු පසට ඇති තාර පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 75 ක් පමණ ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණු පස පිහිටා ඇත. (මාර්ගයේ සිට 3 වන ඉඩම් කොටස)

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ *ගැසට් පත්‍රයේ* 2010.12.03 වැනි දින පළ වී ඇති ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2010.11.22 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2010.11.24 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව, පීඑල්සී අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011- 2456474, 2456477.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011- 3068185, 011- 2572940.
09-210

---

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 283

MOD/DEF/07/01/AVF/RET/367.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරියා 2013 මැයි මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් (උපකරණ පාලක - පොදු රාජකාරී) ඩිංගිරි අප්පුගේ ජයසූරිය, ශ්‍රීලංජාආබමු (නි/8291)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.
09-277

2013 අංක 284

MOD/DEF/07/01/AVF/RET/365.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2013 ජූලි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් අල්ලිසාගේ දේවයාගේ පත්මසූරිය, ශ්‍රීලංජාආබමු (නි/7435)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 22 වැනි දින,
කොළඹ දී ය.
09-275

2013 අංක 285

MOD/DEF/07/01/AVF/RET/366.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2013 ජූලි මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් මුදුගමු හේවගේ සුජිත් ප්‍රියන්ත (නි/6913)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 22 වැනි දින,
කොළඹ දී ය.
09-276

---

2013 අංක 286

MOD/DEF/07/01/AVF/RET/364.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2013 අගෝස්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් සිරිසේනගේ ධර්මසේන, ශ්‍රීලංජාආබමු (නි/7579)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.
09-274

---

## රජයේ නිවේදන

**ඉඩම් මැනුම් සභාව**

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

**2002 අංක 17 දරන මැනුම් පනතේ 43 වන වගන්තිය යටතේ වාර්ෂික බලපත්‍ර අත්හිටුවන ලද ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවන්ගේ නාම ලේඛනය**

| | *ලියාපදිංචි අංකය* | *සම්පූර්ණ නම* | *වාර්ෂික බලපත්‍රය නිකුත් කිරීම අත්හිටුවන ලද කාලය* |
|---|---|---|---|
| (i) | 19900996 | පෙරුම්බඩගේ ඉන්ද්‍රානි මල්ලිකා | 2013.09.01 සිට 2013.11.30 දක්වා |
| (ii) | 19941060 | කාලිදාස වෙනා සාම්රාජා කන්දනාදන් වික්නරාජා | 2013.09.01 සිට 2013.11.30 දක්වා |

කේ. තවලිංගම්,
සභාපති,
ඉඩම් මැනුම් සභාව.

කොළඹ දී ය.
09-164

---

යොමුව : ED/05/69/01/01/113

**1961 අංක 08 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතේ 10 වැනි වගන්තිය යටතේ කරනු ලබන නියෝගය**

මීග/කමරගොඩ රෝමානු කතෝලික සිංහල මිශ්‍ර පාසල, දෙවලපොල

අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන වන මම, 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතේ 10 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ක්‍රියා කරමින්, අංක 13594 හා 1963.04.06 දිනැති ලංකාණ්ඩුවේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද, අංක 2495 දරන පැවරුම් නියෝගයේ උපලේඛන අංක 01හි " BLOCK B" යටතේ විස්තර කොට දක්වා ඇති පර්චස් 27ක භූමි ප්‍රමාණයට පමණක් අදාල වන තාක් දුරට 2013 අගෝස්තු මස 26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

බන්දුල ගුණවර්ධන,
අධ්‍යාපන අමාත්‍ය.

2013 අගෝස්තු මස 26 වැනි දින,
"ඉසුරුපාය",
පැලවත්ත,
බත්තරමුල්ල.
09-314

---

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හඟුරන්කෙත**

වන්දනා ගමන් ආඥාපනත - (175 වැනි අධිකාරය)

**ඓතිහාසික සඟරුවන්කෙත ඇසල මහා පෙරහැර ප්‍රසිද්ධ කිරීම - 2013**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් 175 වැනි අධිකාරිය වූ වන්දනා ගමන් ආඥාපනතේ 02 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝගයන්ට අනුව 2008 අගෝස්තු මස 15 වැනි දිනැති *ගැසට් පත්‍රය* මගින් ඓතිහාසික සඟරුවන්කෙත මහා විෂ්ණු දේවාල පෙරහැර *ගැසට්* කරන ලද පෙරහැරක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

එකී නියෝග ප්‍රකාරව 2013 වසරට අදාල ඓතිහාසික හඟුරන්කෙත මහා විෂ්ණු දේවාල ඇසළ පෙරහැර 2013.09.05 වැනි දින සිට 2013.09.21 වැනි දින දක්වා පැවැත්වෙන බව සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
හඟුරන්කෙත.

09-320

---

**(175 වැනි අධිකාරය වන) වන්දනා ගමන් ආඥාපනත**

ඌව වෙල්ලස්ස, කොටබෝව, කුඩා කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවය - 2013

ඌව වෙල්ලස්ස, කොටබෝව කුඩා කතරගම දේවාලයේ 2013 වාර්ෂික ඇසළ උත්සවය 2013.09.05 වැනි දින කප් සිටුවීමෙන් ආරම්භ වී 2013.09.20 වැනි දින අලුයම දියකැපීමේ මංගල්‍යයෙන් නිමාවට පත්වන බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

02. වන්දනා ගමන් ආඥාපනතේ විධිවිධාන අනුව 1964 ජූලි මස 24 වැනි දින අංක 14117 දරන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි උත්සව කාලය තුල වලංගුව පවතින බව මහජනයාගේ අවධානයට ලක් කරමි.

ඒ. පතිනාදන්,
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ
කොටබෝව කුඩා කතරගම දේවාලයේ ඇසළ උත්සව
කඳවුරු භාර නිලධාරී.

2013 අගෝස්තු මස 26 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව වෙල්ලස්ස, කොටබෝව කුඩා කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවය - 2013**

1964 ජූලි මස 24 වැනි දින අංක 14117 දරන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පළවූ කොටබෝව වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනයාගේ අවධානයට යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධ පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

01. *කඳවුරු ප්‍රදේශය* :

කොටබෝවේ "දහමල් ඔය" නැමති පුරාණ තොටුපළේ සිට සැතපුම් භාගයක අර්ධ විශ්කම්භය ඇතුළත ප්‍රදේශය ඇතුලත් වේ.

02. *ගොඩනැගිලි ඉදිකිරීම්* :

මගෙන් හෝ මගේ බලයලත් නිලධාරියෙකුගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිවෙකු විසින් හෝ 2013.09.05 වැනි දින සිට 2013.09.20 වැනි දින දක්වා කාලය තුළ කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිම ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලලක් හෝ වෙළඳසැලක් ඉදි නොකළ යුතු ය.

03. *යාචකයෝ* :

පූජා පෙදෙසේ හෝ කඳවුරු පෙදෙසේ අන් කිසිම තැනක දී යාචකයින් විසින් හිඟමන් ඉල්ලීම හෝ ලබා ගැනීම ද, කිසිවෙකු විසින් හිඟමන් දීම හෝ බෙදාදීම ද නොකළ යුතු ය.

04. *නෑම සහ සේදීම* :

කොටබෝවේ "දහමල්ඔය" නැමති පුරාණ තොටුපළේ සිට සැතපුම් භාගයක අර්ධ විශ්කම්භය ඇතුලත ප්‍රදේශය තුළ කිසිවෙකු විසින් දිය නෑම හෝ රෙදි සේදීම හෝ සතුන් සේදීම හෝ වාහන සේදීම නොකළ යුතු ය.

05. *වාහන* :

05.01. මගේ හෝ මගේ බලයලත් නිලධාරියෙකුගෙන් ලබාගත් අවසරයක් රහිතව මෝටර් වාහනයක්, බයිසිකලයක්, ගොන් කරත්තයක් හෝ කුමන ආකාරයක හෝ වාහනයක් පූජා පෙදෙසට (දහමල් ඔයෙන් නැගෙනහිරට) පැදවීම හෝ ඇතුළු කිරීම නොකළ යුතු ය.

05.02 කඳවුරට අයත් කඩබිම් ප්‍රදේශයේ වාහන නතර කිරීමට වෙන් කර ඇති රිය ගාල්වල හැර අන් කිසිදු ස්ථානයක වාහනයක් නතර කර නොතැබිය යුතු ය.

06. *කාවාඩි කඩ* :

මගේ හෝ මගේ බලයලත් නිලධාරියෙකුගෙන් ලබාගත් අවසර පත්‍රයක් මත මිස කිසිම ස්ථානයක කිසිවෙකු විසින් කාවාඩි කඩ පිහිටවනු නොලැබිය යුතු ය.

07. *වෙළඳාම* :

07.01. මගෙන් හෝ මගේ බලයලත් නිලධාරියෙකුගේ ලිඛිත අවසරයකින් තොරව කඳවුරුභූමිය තුළ තාවකාලික කඩ බදු දීම හෝ වෙන්දේසි කිරීම නොකළ යුතු ය. තවද ම විසින් හෝ මගේ බලයලත් නිලධාරියෙකු විසින් ප්‍රදේශය තුළ නියම නොකරන ලද ස්ථානයක එවැනි කටයුතු සිදු කිරීම කිසිවෙකු විසින් නොකළ යුතු ය.

07.02. පූජා පෙදෙස, මගී පාලමෙහි මාර්ගය හා කඳවුරු ප්‍රදේශය තුළ ගං ඉවුර අයුතු ලෙස ආක්‍රමණය කරන පරිදි යම් මඩුවක් තැනීම හෝ යම් ඉදිකිරීමක් කිරීම හෝ යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් විශාල කිරීමක් නොකළ යුතු ය . එකී ප්‍රදේශයන්හි සංචාරක වෙළඳාම ද තහනම් ය.

07.03. ම විසින් හෝ මගේ බලයලත් නිලධාරියෙකු විසින් ඒ සඳහා අවසර දුන් ස්ථානය හැර කිසිවෙකු විසින් තින්නෝරු, අයිස්ක්‍රීම්, පූජා භාණ්ඩ, පූජා වට්ටි, ආහාර ද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය වෙළඳාම් නොකළ යුතු ය.

07.04. යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් ගෙනයාමේ කාර්යය සඳහා සෑම ගොඩනැගිල්ලක, ඉදිකිරීමක හෝ ස්ථානයක ම ප්‍රමාණයෙන් ඝණ අඩි 04 1/2 කට අඩු නොවන කුණු බාල්දියක් සපයා තිබිය යුතු ය. කුණු බාල්දියට කුණු දමන විට හා ඉන් ඒවා ඉවත් කරන විට හැර අන් සෑම විටම කුණු බාල්දිය පියනකින් වසා තැබිය යුතු ය. තව ද සෞඛ්‍ය කම්කරුවන් විසින් කුණු ඉවත ගෙන යාම සඳහා නියම කරනු ලැබූ වේලාවන්හි දී ඒ භාජන ඒ ස්ථානවල පිටතින් තැබිය යුතු ය.

07.05. විකිණීමට තබා ඇති සකස් කළ සියලු ආහාර පාන ද්‍රව්‍ය මැස්සන්ගෙන් ආරක්ෂාවන පරිදි ආවරණය සහිත පෙට්ටිවල රඳවා තැබිය යුතු ය.

08. *සනීපාරක්ෂාව සහ මහජන සෞඛ්‍ය* :

ඒ කාර්යය සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක හැර කඳවුරු ප්‍රදේශය ඇතුලත කිසිවෙකු විසින් මළ මූත්‍ර පහ නොකළ යුතු අතර, සලසා ඇති ස්ථානයක හෝ භාජනයක හැර කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිවෙකු විසින් ද්‍රව හෝ ඝණ කුණුකසල කිසිවක් නොදැමිය යුතු ය.

ම විසින් දෙන ලද මෙම ආඥාවන් කිසිම තැනැත්තෙකු විසින් කඩ නොකළ යුතු ය.

ඒ. පතිනාදන්,
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ
කොටබෝව කුඩා කතරගම දේවාලයේ ඇසළ උත්සව
කඳවුර භාර නිලධාරී.

2013 අගෝස්තු මස 26 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.
09-267

---

**දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය**

1965 අංක 3 දරන දුම්රිය දෛනික වැටුප් ලබන යහසාධක සංගම් පනතේ 30අ(1) ප්‍රකාර ක්‍රියාකාරී මණ්ඩලය අහෝසි කිරීම

ලංකා දුම්රිය සේවක යහසාධක සංගමයේ ව්‍යවස්ථාව පරිදි ඡන්දය නොපැවැත්වීම හා එහි වගන්ති උල්ලංඝණය වීම නිසා 2011.05.29 දින පැවති 43 වැනි සංවත්සරයේදී තේරී පත්වූ, සභාපති, උප සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු පාලන ක්‍රියාකාරී මණ්ඩලය ව්‍යවස්ථාවට අනුකූලව පත්වී නොමැති බැව් අනාවරණය වී ඇති බැවින් යථෝක්ත පනතේ 30අ(1) වගන්තිය ප්‍රකාර ප්‍රවාහන ලේකම් වෙත පැවරී ඇති බලතල අනුව ප්‍රවාහන ලේකම්ගේ අංක එම්ටී/03/අයි/පොදු 12 හා 2013.01.16 ලිපියෙන් නියෝග කර ඇති පරිදි එම පාලන ක්‍රියාකාරී මණ්ඩලය විසුරුවා හරිනු ලැබේ.

පනතේ 30අ(2) ප්‍රකාර පහත නම් සඳහන් අයගෙන් සමන්විත විශේෂ පරිපාලන කමිටුව පත්කරනු ලැබේ.

1. පී. ඒ. ක්‍රිශාන්ත මහතා - යාන්ත්‍රික ඉංජිනේරු
2. එල්. එම්. ඩී. සමන්දෙනිය මහතා - සුභසාධක නිලධාරි (සම්බන්ධීකරණ)
3. ඩබ්. ඩී. ගුණතිලක මහතා - ට්‍රොලිමන්

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

09-329

---

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මන්මුනෙයි නිරිත**

වන්දනා ගමන් ආඥාපනත

**මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ශ්‍රී කන්දොන්රීශ්වරර් දේවස්ථානයේ වාර්ෂික උත්සවය - 2013**

ඉහත සඳහන් දේවස්ථානයේ වාර්ෂික උත්සවය 2013 සැප්තැම්බර් මස 07 වැනි දින ආරම්භ වී 2013 සැප්තැම්බර් මස 22 වැනි දින සිට රථෝත්සවය හා 2013 සැප්තැම්බර් මස 23 වැනි දින දිය කැපීමේ උත්සවය පැවැත්වෙන බව වන්දනා කරුවන්ට හා මෙම උත්සවය හා සම්බන්ධවී ක්‍රියා කරන අයටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංක 9886 හා 1984.07.16 වැනි දින දරන රජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති දැනට බලාත්මකව පවතින සියළුම නීති රීති වන්දනාකරුවන් හා මෙම උත්සවයට සම්බන්ධව ක්‍රියා කරන අයත් සැලකිල්ලට ගන්නා ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

සිවප්‍රියා විල්වරත්නම්,
ප්‍රාදේශීය ලේකම්,
මන්මුනෙයි නිරිත,
පට්ටිපලයි.

09-326

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**මහජන බැංකුව - මූලස්ථාන ශාඛාව**

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 ජූනි 29 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 2010.09.13 වැනි දින අංක 9099 දරන උකස් බැඳුම්කරය ප්‍රකාරව අයවිය යුතු මුදල් ගෙවීම අංක පී. වී. 64682 යටතේ ලියාපදිංචි වී ඇති 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථාපරිදි සංස්ථාගත කර ඇති සමාගමක් වන ග්‍රීන් ස්කේෆ් කෝ එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 9099 දරන උකස් බැඳුම්කරය මත දැනට මහජන බැංකුව වෙත රු. 4,069,830.59 (රුපියල් මිලියන හතරයි හැටනව දහස් අටසිය තිහයි ශත පනස් නවයක්) වූ මුදලක් මහජන බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

එකී රු. 4,069, 830.59 (රුපියල් මිලියන හතරයි හැටනව දහස් අටසිය තිහයි ශත පනස් නවයක්) වූ මුදල සහ එකී රු. 4,069,830.59 මත 2012.01.11 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට 16% ක (සියයට දහසයක) තවදුරටත් වූ පොළියක් ද සහ වෙනත් විකුණුම් පිරිවැය සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් එම ගෙවීම අඩුකිරීමෙන් පසුව එකී මුදල් අයකර ගැනීම සඳහා අංක 9099 දරන ඉහත කී උකස් බැඳුම්කරය මගින් ඉහත කී මහජන බැංකුව වෙත උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර අර්වින් පෙරේරා මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කූරු කෝරළේ, රාගම් පත්තුවේ හැඳල පිහිටා ඇති හැඳල උප කාර්යාලයේ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ කාමෙල් මාවතේ වරිපනම් අංක 83 දරන ගොඩනැගිල්ල සහ වෙනත් සියලු දේ ද සමග "අලිබි ලොජ් ලී හැඳල ෆාම්" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරුවන කේ. ආර්. එස්. ෆොන්සේකා මහතා විසින් සහතික කරන ලද 1998 ජූලි මස 20 වැනි දින අංක 1549 දරන පිඹුරට අනුව ලොට් අංක 2 ලෙස ලකුණුකර ඇත්තාවූ ද, උතුරට : පෞද්ගලික පාර ද, නැගෙනහිරට : කිරිල්ලගස් දෙනිය පාර ද, දකුණට : නොයෙල් වික්‍රමසිංහ යන අයගේ ඉඩම ද, බටහිරට : ලොට් අංක 1 ද, යන මායිම් තුළ පිහිටි කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ B 1056/120 යටතේ ලියාපදිංචි වී ඇති එකී අංක 1549 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් විසිහයයි දශම දෙකයි පහක් හෙවත් (අ. 0 රූ. 0 පර්. 26.25) හෙක්ටයාර් 0.0664ක් වූ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි.

කලාප කළමණාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකු කලාප ප්‍රධාන කාර්යාලය,
(බස්නාහිර කලාපය 1)
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.
09-317

---

පීවී 82654.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "බිස්නස් වෙන්චර් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2011.11.22 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "බිස්නස් වෙන්චර් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "බිස්නස් වෙන්චර් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 අගෝස්තු මස 23 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
09-336

---

පීවී 83527.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "අයිසෝයු සිලෝන් හොලිඩේ ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2012.01.09 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "අයිසෝයු සිලෝන් හොලිඩේ ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "අයිසෝයු සිලෝන් හොලිඩේ ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 අගෝස්තු මස 23 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
09-337

---

පීවී 80807.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "කසසුසාන (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2011.08.22 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "කසසුසාන (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "කසසුසාන (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 අගෝස්තු මස 23 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
09-338

---

පීවී 60427.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "විස්ටානෙට් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2007.06.27 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "විස්ටානෙට් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "විස්ටානෙට් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 අගෝස්තු මස 23 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
09-340

---

පීවී 85987.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ෆයර්ෆ්ලවර් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2012.05.24 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ෆයර්ෆ්ලවර් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ෆයර්ෆ්ලවර් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 අගෝස්තු මස 23 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
09-342

---

පීවී 60679.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "බියර් ස්ටෝ කාගෝ (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2007.07.17 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "බියර් ස්ටෝ කාගෝ (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "බියර් ස්ටෝ කාගෝ (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 අගෝස්තු මස 23 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
09-343

---

පීවී 60531.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ඇම්රෝ ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2007.07.04 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ඇම්රෝ ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ඇම්රෝ ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 අගෝස්තු මස 23 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
09-345

---

පීවී 62099.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "රෝයල් කොලේජ් ඔෆ් එවියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2007.11.20 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "රෝයල් කොලේජ් ඔෆ් එවියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "රෝයල් කොලේජ් ඔෆ් එවියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 අගෝස්තු මස 23 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
09-347

---

පීවී 20293.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "යුකී නිපොන් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2006.08.11 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "යුකී නිපොන් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "යුකී නිපොන් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (*රාජකාරි ඉටුකිරීම*) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2013 අගෝස්තු මස 23 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
09-348

---

පීවී 65853.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "රොබට් ඉන්ටිග්‍රේටඩ් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2008.10.10 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "රොබට් ඉන්ටිග්‍රේටඩ් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

